ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date. 2022.08.11

පැමිණිලි පාර්ශවය : අයි.ඩී.පී.කුමාරසිරි මහතා,
අංක 89/1, පුද්ගලික නිවාස,
හිඟුරාන.

වගඋත්තර පාර්ශවය : සභාපති,
සංවර්ධන ලොතරැයි මණ්ඩලය,
අංක 356,
ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවත,
කොළඹ 02.

**පැමිණිලි අංකය : HRC/AM/22/24/B/IN**

**පැමිණිල්ලේ කරුණු දැක්වීම :**

පැමිණිලිකරු 2024.02.01 දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් තමා සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ වසර 22කට ආසන්න කාලයක් සේවයේ නිරතව සිටින බවත්, මේ වන විට උතුරු නැගෙනහිර පළාත් දෙක භාර කලාප කලමණාකරු වශයෙන් සේවය කරන බවත් සඳහන් කර ඇත. සංවර්ධන ලොතරැයි මණ්ලයේ පුරප්පාඩුව පවතින සහකාර සාමාන්‍යාධිකාරී (විකුණුම්) තනතුරු දෙකක් සඳහා පුවත්පත් දැන්වීම් පල කළ අවස්ථාවේදී තමා ද අයදුම් කළ බවත්, අදාළ සම්මුඛ පරීක්ෂණය 2022.11.21 දින පැවැත්වීමට නියමිතව තිබූ නමුත් එය අවලංගු කර නැවත අයදුම්පත් කැඳවා 2024.01.30 දින සම්මුඛ පරීක්ෂණය පැවැත්වූ බවත්, එම සම්මුඛ පරීක්ෂණය සඳහා අභ්‍යන්තර අයදුම්කරුවන් 05ක් ඇතුළු 11 දෙනෙක් කැඳවා තිබූ බවත්, ඒ අතරින් ඉහළම අධ්‍යාපන සුදුසුකම්, සේවා කාලය, සේවා පළපුරුද්ද, භාෂා නිපුණතාවය හා ලොතරැයි අලෙවියේ උන්නතිය සඳහා සිදු කරන ලද වැඩිම දායකත්වය අනුව ඉහළම සුදුසුකම් සපුරා ඇත්තේ තමා වුවද තමාට අදාළ තනතුර ලබා නොදීමට කළමණාකාරීත්වය කටයුතු කර ඇති බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත. ඒ අනුව සහකාර සාමාන්‍යාධිකාරී (විකුණුම්) තනතුරු දෙකෙන් එකක් තමා වෙත ලබාදීම හෝ අදාළ සම්මුඛ පරීක්ෂණය අවලංගු කර සාධාරණ අපක්ෂපාතී විනිවිදභාවයෙන් යුක්ත මණ්ඩලයක් හමුවේ නැවත සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙස ඉල්ලා ඇත.

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක. 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு - 04. / No. 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairman: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

**වගඋත්තර පාර්ශවයේ සැලකිරීම :**

පැමිණිල්ලට අදාළව 2024.02.20 දිනැතිව වාර්තාවක් යොමු කරමින් සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සභාපතිවරයා සඳහන් කර සිටින්නේ, සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අනුමත බඳවා ගැනීමේ පටිපාටිය අනුව සහකාර සාමාන්‍යාධිකාරී (විකුණුම්) තනතුරෙහි පුරප්පාඩු දෙකක් පැවති බවත්, එම තනතුරු සඳහා බඳවා ගැනීමට 2019 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා අයදුම්පත් කැඳවූ බවත්, 2019 වර්ෂයේ පැවති සම්මුඛ පරීක්ෂණයේදී එක් අයදුම්කරුවෙකු පමණක් ලකුණු 40ක් ලබා තේරී පත් වුවද ඔහු එම තනතුර ලබාගැනීම ප්‍රතික්ෂේප කළ බවත්, 2021 වර්ෂයේ නැවත අයදුම්පත් කැඳවා, ඒ සඳහා පැවැති සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසු අයදුම්කරුවෙකු තෝරා ගැනීමට නොහැකි වූ බවත්, ඒ අනුව මෙම තනතුරුවල වැඩ බැලීමේ පදනමින් රාජකාරී කටයුතු කිරීමට අභ්‍යන්තර අයදුම්කරුවන් පත්කිරීමට 2021.11.29 දින පැවති 257 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී තීරණය කර, එම තීරණය පරිදි පත් කිරීම සිදුකර ඇති බවත් ය.

අනතුරුව 2023 වර්ෂයේ සහකාර සාමාන්‍යාධිකාරී (විකුණුම්) තනතුරේ පුරප්පාඩු 02 සඳහා සුදුසු අයදුම්කරුවන් බඳවා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ හා මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව 2023.04.18 දින අයදුම්පත් කැඳවා ඇත. එලෙස ලැබුණු අයදුම්පත් 23න් බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් සුදුසුකම් අනුව සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීමට තේරී පත්වූ අයදුම්කරුවන් සංඛ්‍යාව 11ක් වන අතර, එම අයදුම්කරුවන්ට විධිමත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් 2024.01.30 දින සම්මුඛ පරීක්ෂණය පවත්වා ඇත. එම සම්මුඛ පරීක්ෂණය සඳහා අභ්‍යන්තර අයදුම්කරුවන් 05ක් සහ බාහිර අයදුම්කරුවන් 03ක් පෙනී සිට ඇත.

2024.01.30 දින පැවති සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයන් ලෙස සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සභාපති/ප්‍රධාන විධායක නිලධාරී අජිත් ගුණරත්න නාරංගල මහතා, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික නීතිඥ ජෙනට් ජයවර්ධන මහත්මිය, මුදල් අමාත්‍යාංශයේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් සම්පත් මන්ත්‍රිනායක මහතා, සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී අනුර ජයරත්න මහතා සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි) චානක දොඩංගොඩගේ මහතා කටයුතු කර ඇත.

උක්ත සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමට දින කිහිපයකට පෙර සිටම පැමිණිලිකරු සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ඉහළ කළමණාකාරණ සාමාජිකයන් නියෝජනය කරන වට්ස්ඇප් සමූහයක් තුළ සටහන් තබමින් කලමණාකාරීත්වයට බලපෑම් සිදු කර ඇති බවත්, ඔහුට සාධාරණයක් ඉටු නොවුනහොත් මණ්ඩලයේ වසර 22ක රහසිගත තොරතුරු මාධ්‍ය වෙත ඉදිරිපත් කරන බවට හා ජනාධිපති වෙත වාර්තා කරන බවටත් සඳහන් කරමින් කළමනාකාරීත්වයට තර්ජනය කර ඇත.

2023.01.30 දින පැවති සම්මුඛ පරීක්ෂණයේ දී සෑම අයදුම්කරුවෙකුටම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ස්වාධීනව ඇගයීමක් කළ බවත්, ඔවුන්ගේ අධ්‍යාපන සුදුසුකම්, අතිරේක පළපුරුද්ද, ඉදිරි අලෙවි සැලසුම්, අලෙවි ප්‍රවර්ධන උපක්‍රම, තරඟකාරී ආයතන සමඟ එකම වෙළෙඳ පොල තුළ එකම අලෙවි නියෝජිතයන් සමඟ කටයුතු කිරීමේ දී භාවිතා කරන උපක්‍රම, අලෙවි නියෝජිතයන් /සහායකයන් වැඩි කර ගන්නා ආකාරය, නව තාක්ෂණය යොදා ගනිමින් අලෙවි ප්‍රවර්ධන ක්‍රම හා නව පාරිභෝගිකයන් ඇති කර ගන්නා ක්‍රම පිළිබඳව සමස්ථ වශයෙන් ඇගයීමක් සිදු කර ලකුණු ලබාදීම සිදු කර ඇති අතර, පැමිණිලිකරුගේ අවබෝධය යම් පළාතකට, ප්‍රදේශයකට සීමා වන ලෙස ඉදිරිපත් වූ බව ද වැඩිදුරටත් සඳහන් කර ඇත. තවද පැමිණිලිකරු වට්ස්ඇප් සමූහය තුළ පල කළ අදහස් සම්බන්ධයෙන් නිදහසට කරුණු විමසීමෙන් අනතුරුව එම කරුණු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කර ඇති අතර, අදාළ සම්මුඛ පරීක්ෂණය ඉතා විනිවිදභාවයෙන් හා සාධාරණව සිදු කළ බවට උක්ත වාර්තාව මඟින් වැඩිදුරටත් කරුණු දක්වා ඇත.

**නිරීක්ෂණ :**

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අනුමත බඳවා ගැනීමේ පටිපාටිය ප්‍රකාරව පුරප්පාඩුව පැවති සහකාර සාමාන්‍යාධිකාරී (විකුණුම්) තනතුරෙහි පුරප්පාඩු 2ක් පිරවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ හා මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව 2023.04.18 දින ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් පළකරමින් අයදුම්පත් කැඳවා ඇත. අදාළ තනතුර සඳහා අයදුම්පත් 23ක් ලැබී ඇති අතර, බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් සුදුසුකම්වලට අනුව සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්කරුවන් 11දෙනෙක් කැඳවා ඇත. එම අයදුම්කරුවන් අතරින් අභ්‍යන්තර අයදුම්කරුවන් 5ක් සහ බාහිර අයදුම්කරුවන් 3ක් සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිට ඇත.

අදාළ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින් ලෙස සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සභාපති/ප්‍රධාන විධායක නිලධාරි අජිත් ගුණරත්න නාරාගල මහතා, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික නීතිඥ ජෙනට් ජයවර්ධන මහත්මිය, සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී අනුර ජයරත්න මහතා, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි) චානක දොඩංගොඩගේ මහතා සහ මුදල් අමාත්‍යාංශයේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් සම්පත් මන්ත්‍රීනායක මහතා කටයුතු කර ඇත.

සම්මුඛ පරීක්ෂණයේදී පහත පරිදි ලකුණු ලබා දී ඇත.

| | | |
|---|---|---|
| අතිරේක පළපුරුද්ද | - | ලකුණු 30 |
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | - | ලකුණු 30 |
| අනෙකුත් කුසලතා හා කාර්යඵලයන් | - | ලකුණු 15 |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කාර්යඵලය | - | ලකුණු 25 |

සහකාර සාමාන්‍යාධිකාරී (විකුණුම්) තනතුර සඳහා බඳවා ගැනීම සඳහා මීට ඉහත අවස්ථාවල පවත්වන ලද සම්මුඛ පරීක්ෂණවලදී (2019.08.23, 2021.05.04 සහ 2021.11.05 යන දිනවල) අතිරේක අධ්‍යාපන සුදුසුකම් සඳහා ලකුණු ලබා දී ඇති ආකාරය සහ 2024.01.30 දින පැවති සම්මුඛ පරීක්ෂණයේදී අතිරේක අධ්‍යාපන සුදුසුකම් සඳහා ලකුණු ලබා දී ඇති ආකාරය පහත පරිදි දැක්විය හැකිය.

| 2019.08.23, 2021.05.04 සහ 2021.11.05 යන දිනවල පැවති සම්මුඛ පරීක්ෂණවලදී අතිරේක අධ්‍යාපන සුදුසුකම් සඳහා ලකුණු ලබාදී ඇති ආකාරය | | 2024.01.30 දින පැවති සම්මුඛ පරීක්ෂණයේදී අතිරේක අධ්‍යාපන සුදුසුකම් සඳහා ලකුණු ලබාදී ඇති ආකාරය | |
|---|---|---|---|
| Master (2 years) | 09 | Master (2 years) | 07 |
| Master (1 year) | 07 | | |
| Post Graduate Diploma | 05 | Post Graduate Diploma | 05 |
| Other Diploma<br>*(More than 1 year, Maximum 2 year)* | 04 | Other Diploma<br>*(More than 1 year, Maximum 2 year)* | 04 |
| Other Intermediate Course<br>*(Maximum 3 x 1)* | 03 | SLIM Certificate<br>*(Maximum 04 - 2 x 4)* | 08 |
| Certificate Course<br>*(More than 3 months, Maximum 2 x 1)* | 02 | Other Qualification<br>*(More than 3 months, Maximum 2 x 1)* | 06 |

ඒ අනුව, සහකාර සාමාන්‍යාධිකාරී (විකුණුම්) තනතුරට බඳවා ගැනීම සඳහා 2024.01.30 දින පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයේදී යොදා ගන්නා ලද ලකුණු ලබාදීමේ පටිපාටියේ වෙනස්කම් පිළිබඳව මානව හිමිකම් කොමිෂන් සභාව විසින් වගඋත්තර පාර්ශවය වෙතින් විමසන ලද අතර, ඊට පිළිතුරු වශයෙන් වගඋත්තර ආයතනයේ සාමාන්‍යාධිකාරී විසින් 2024.09.03 දිනැති අංක HR/03/PF/105 දරණ වාර්තාව යොමු කරමින් පහත කරුණු ඉදිරිපත් කර ඇත.

සාමාන්‍යයෙන් සම්මුඛ පරීක්ෂණයකදී ලකුණු ලබාදීමේදී බඳවා ගැනීමේ පටිපාටියේ ඇතුළත්ව ඇති මූලික නිර්ණායක පදනම් කරගන්නා බවත්, එම මූලික නිර්ණායකයන් වන්නේ අතිරේක පළපුරුද්ද සඳහා ලකුණු 30 ද, අතිරේක අධ්‍යාපන සුදුසුකම් සඳහා ලකුණු 30 ද, අනෙකුත් කුසලතා හා කාර්යඵලයන් සඳහා ලකුණු 15 හා සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කාර්යඵලය සඳහා ලකුණු 25 ලෙස බවත්, මෙම මූලික නිර්ණායක සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට වෙනස් කළ නොහැකි බවත් දක්වා ඇත. මෙම මූලික නිර්ණායකවලට ලකුණු ලබාදීම සඳහා වන උප නිර්ණායක සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් අදාළ තනතුරට සුදුසු පරිදි තීරණය කර ඇති බව දක්වා ඇත. ඒ අනුව 2024.01.30 දින සහකාර සාමාන්‍යාධිකාරී (විකුණුම්) තනතුරට බඳවා ගැනීම සඳහා පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයේ ලකුණු පටිපාටිය එම සම්මුඛ පරීක්ෂණය පවත්වන ලද දිනයේම සකස් කර අනුමත කරගත් පටිපාටියකි. මීට ඉහත අවස්ථාවලදී සහකාර සාමාන්‍යාධිකාරී (විකුණුම්) තනතුරට බඳවා ගැනීම සඳහා 2019.08.23, 2021.05.04, 2021.05.11 යන දිනවල පවත්වා ඇති සම්මුඛ පරීක්ෂණවලදී, අදාළ සම්මුඛ පරීක්ෂණය පැවති දිනයේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය නියෝජනය කළ සාමාජිකයින් විසින් සකස් කරගත් අනු නිර්ණායක මත පදනම්ව ලකුණු ලබා දී ඇත. එම එක් එක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විවිධ සාමාජිකයින්ගෙන් සමන්විත වී ඇත. එම නිසා මූලික නිර්ණායකවලට ලකුණු ලබාදීමේ සමානතාවයක් පැවතුනද උප නිර්ණායකවලට ලකුණු ලබාදීමේදී අනුගමනය කර ඇති ක්‍රමවේදය වෙනස් වී ඇති බව වැඩිදුරටත් උක්ත වාර්තාව මඟින් දක්වා ඇත.

මූලික නිර්ණායක අතරින් "අතිරේක අධ්‍යාපන සුදුසුකම්" සඳහා ලකුණු ලබාදීමේදී, එහි උප නිර්ණායක සඳහා ලකුණු ලබාදීමට යොදාගෙන ඇති පටිපාටිය මීට ඉහත පැවති සියලු සම්මුඛ පරීක්ෂණවලදී කිසිදු වෙනස් කිරීමකින් තොරව එක හා සමානව යොදාගෙන ඇති නමුත් 2024.01.30 දින පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයේදී "අතිරේක අධ්‍යාපන සුදුසුකම්" යටතේ මෙතෙක් සලකා බලන ලද උප නිර්ණායක වෙනස් කිරීමට කටයුතු කර ඇති බව නිරීක්ෂණය වේ.

ඒ අනුව මීට ඉහත අවස්ථාවලදී පශ්චාත් උපාධිය (Masters) සඳහා ලකුණු ලබාදීමේදී වසර දෙකක පශ්චාත් උපාධිය සඳහා ලකුණු 09ක් ද වසරක පශ්චාත් උපාධිය සඳහා ලකුණු 07ක් ද ලබා දී ඇත. කෙසේනමුත් 2024.01.30 දින පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයේදී පශ්චාත් උපාධිය සඳහා ලකුණු 07ක් පමණක් ලබා දී ඇත. තවද 2024.01.30 දින පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයේදී SLIM සහතික සඳහා ලකුණු 08ක් ද වෙනත් සුදුසුකම් සඳහා ලකුණු 06ක් ද වෙන් කර ඇති බවත්, එලෙස ලකුණු වෙන් කිරීම මින් පෙර පවත්වන ලද සම්මුඛ පරීක්ෂණවලදී සිදුව නොමැති බවද නිරීක්ෂණය වේ.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් යම් තනතුරකට බඳවා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීමේදී අනුමත බඳවා ගැනීමේ පටිපාටියේ එක් එක් තනතුර සඳහා වන මූලික නිර්ණායක යටතේ වන උප නිර්ණායක සඳහා ලකුණු ලබාදෙන ආකාරය සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනයේදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් තීරණය කර එම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ම අනුමත කිරීම අඛණ්ඩව සිදුකර ගෙන ආ පිළිවෙතක් බව නිරීක්ෂණය වේ.

ඒ අනුව, අදාළ තනතුරට සුදුසු පරිදි සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනයේදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් මූලික නිර්ණායක යටතේ වන උප නිර්ණායක සඳහා ලකුණු ලබාදෙන ආකාරය

තීරණය කිරීම තුළින් සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිටින අයදුම්කරුවන්ට අසාධාරණයක් සිදුවන බව නිරීක්ෂණය වේ. තවද එකී ලකුණු ලබාදීමේ පටිපාටිය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ම අනුමත කරගැනීම හරහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින්ට සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිටින යම් අයදුම්කරුවෙකුට වාසිසහගත වන ආකාරයට අදාළ ලකුණු ලබාදීමේ පටිපාටිය සකස් කිරීමේ හැකියාව පවතින බව ද නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු විසින් සහකාර සාමාන්‍යාධිකාරී (විකුණුම්) තනතුරට බඳවා ගැනීම සඳහා පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයේදී අසාධාරණයක් සිදුවූ බව සඳහන් කරමින් මුදල් අමාත්‍යාංශය වෙත ද ලිපියක් යොමු කර ඇත. ඒ අනුව, මුදල් අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය විසින් මේ සම්බන්ධයෙන් ස්වාධීන විමර්ශනයක් පවත්වා ඇත.

එකී විමර්ශන වාර්තාව අධ්‍යනය කිරීමේදී පහත කරුණු නිරීක්ෂණය විය.

1. සහකාර සාමාන්‍යාධිකාරී (විකුණුම්) තනතුරට බඳවා ගැනීම සඳහා 2024.01.30 දින සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමට දින කිහිපයකට පෙර පැමිණිලිකරු විසින් සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ඉහළ කළමණාකාරණ සාමාජිකයන් නියෝජනය කරන වට්ස්ඇප් සමූහයක් තුළ සටහන් තබමින් "සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් අතරින් ඉහලම අධ්‍යාපන සුදුසුකම්, සේවා කාලය, පළපුරුද්ද, ඉහලම කාර්යඵල, භාෂා නිපුණත්වය, ලොතරැයියේ උන්නතියට සිදුකරන ලද වැඩිම දායකත්වය අනුව මෙම තනතුර සඳහා වැඩිම සුදුසුකම් සපුරා තිබූ අපේක්ෂකයා මම වෙමි" යන්නත් "අවම සුදුසුකම් සහිත හෝ කාර්යය සාධනයක් නොමැති අපේක්ෂකයන් තෝරා ගැනීමෙන් මෙම සම්මුඛ පරීක්ෂණය අසාධාරණ, නීතිවිරෝධී සහ පක්ෂග්‍රාහී විය හැකි බවත්" ප්‍රකාශ කර ඇති අතර, එම වට්ස්ඇප් පණිවිඩ හරහා පැමිණිලිකරු විසින් සම්මුඛ පරීක්ෂණයට පෙර ආයතනයේ කළමණාකාරීත්වයට බලපෑම් සිදු කර ඇත.

2. අදාළ සම්මුඛ පරීක්ෂණයට පෙර පැමිණිලිකරු විසින් ආයතනය පිළිබඳ සංවේදී තොරතුරු මාධ්‍ය වෙත යොමු කරන බවට වට්ස්ඇප් සමූහයක් තුළ ප්‍රකාශ කර තිබීම විනය විරෝධී ප්‍රකාශයක් බවත්, පැමිණිලිකරු සම්මුඛ පරීක්ෂණය සඳහා නොකැඳවීමට තරම් හේතුවක් වන බවත්, පැමිණිලිකරු සම්බන්ධයෙන් විනය කටයුතු සිදුකළ යුතු තත්ත්වයක්ද නිර්මාණය කර තිබූ බවත් දක්වා ඇත.

3. තවද මෙම බලපෑම් කිරීම් සම්බන්ධයෙන් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සභාපතිවරයා විසින් ලකුණු ලබාදුන් ලේඛනයේ ද සටහන් යොදා ඇත.

4. තනතුර සඳහා තෝරාගත් අයදුම්කරුවන්ට සාපේක්ෂව පැමිණිලිකරුගේ ලොතරැයි විකුණුම් කාර්යසාධනය ඉහළ නමුත් ඔහුගේ චර්යාධර්මවල පවතින දූර්වලතා හේතුවෙන් මෙම පැමිණිලිකරු සහකාර සාමාන්‍යාධිකාරී (විකුණුම්) තනතුර සඳහා තෝරාගෙන නොමැත.

5. සහකාර සාමාන්‍යාධිකාරී (විකුණුම්) තනතුරට බඳවා ගැනීම සඳහා පැවති සම්මුඛ පරීක්ෂණයේදී එම තනතුර සඳහා තේරී පත්වූ සී.සී. අයිලප්පෙරුම මහතා විසින් ලොතරැයිපත් දිනුම් අදින දින සිට මාස 6ක කාලයක් ඉක්මවූ දිනුම් සහිත ලොතරැයිපත් 27ක් සඳහා රු. 11,000ක මුදලක් ගෙවීම සම්බන්ධයෙන් පවත්වන ලද මූලික විමර්ශනයකදී චෝදනා ලත් නිලධාරියෙකි. සංශෝධිත මූලික විමර්ශන වාර්තාවේ නිර්දේශ අනුව, සිද්ධියට සම්බන්ධ නිලධාරීන් තිදෙනා තමන් වෙත පැවරී ඇති වගකීම් හා වගවීම පැහැර හරිමින් කටයුතු කිරීම හේතුවෙන් මෙම

ප්‍රශ්නගත ගෙවීමට වගකිව යුතු බව දක්වා ඇති අතර, ඒ අනුව අදාළ නිලධාරීන්ට චෝදනා පත්‍ර 3ක් කෙටුම්පත් කර ඇත.

6. කරුණු එසේ තිබියදී 2024.02.21 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ අංක 292/8 දරණ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි, මෙය හිතාමතා හෝ වැරදි සහගත ක්‍රියාවක් ලෙස නොපෙනෙන බැවින් ඒ සඳහා විනය ක්‍රියාමාර්ග අවශ්‍ය නොවන බව දක්වා ඇත.

මුදල් අමාත්‍යාංශය විසින් පවත්වන ලද ස්වාධීන විමර්ශනය අවසානයේදී පහත නිගමනවලට එළඹී ඇත.

1. සහකාර සාමාන්‍යාධිකාරී (විකුණුම්) තනතුරට බඳවා ගැනීම සඳහා පැවති සම්මුඛ පරීක්ෂණයේදී එම තනතුර සඳහා තේරී පත්වූ සී.සී. අයිලප්පෙරුම මහතා විසින් ලොතරැයිපත් දිනුම් අදින දින සිට මාස 6ක කාලයක් ඉක්මවූ දිනුම් සහිත ලොතරැයිපත් 27ක් සඳහා රු. 11,000ක මුදලක් ගෙවීම සම්බන්ධයෙන් පවත්වන ලද මූලික විමර්ශනයකදී චෝදනාලත් නිලධාරියෙකි.

   සංශෝධිත මූලික විමර්ශන වාර්තාවේ නිර්දේශ අනුව, සිද්ධියට සම්බන්ධ නිලධාරීන් තිදෙනා තමන් වෙත පැවරී ඇති වගකීම් හා වගවීම පැහැර හරිමින් කටයුතු කිරීම හේතුවෙන් මෙම ප්‍රශ්නගත ගෙවීමට වගකිව යුතු බව නිර්දේශ කර ඇති අතර, අදාළ නිලධාරීන්ට චෝදනා පත්‍ර 3ක් කෙටුම්පත් කර ඇත.

   කරුණු එසේ තිබියදී සී.සී. අයිලප්පෙරුම මහතා 2024.02.05 දින සහකාර සාමාන්‍යාධිකාරී (විකුණුම්) තනතුරට පත්කර ඇත. එම පත්වීම ලබාදීමෙන් පසුව 2024.02.21 දින අධ්‍යක්ෂ මණ්ඩල විසින් තීරණය කර ඇත්තේ, සී.සී. අයිලප්පෙරුම මහතා ඇතුළු නිලධාරීන් තිදෙනෙක් විසින් සිදුකරන ලද ක්‍රියාව හිතාමතා හෝ වැරදි සහගත ක්‍රියාවක් ලෙස නොපෙනෙන බැවින් ඒ සඳහා විනය ක්‍රියාමාර්ග අවශ්‍ය නොවන බවයි.

   ඒ අනුව සී.සී. අයිලප්පෙරුම මහතා සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සිදුවෙමින් පැවතියදී අදාළ පත්වීම ලබාදීමට කටයුතු කර ඇති බව පෙනී යයි.

2. තවද සංශෝධිත මූලික විමර්ශන වාර්තාවේ චෝදනා පත්‍ර කෙටුම්පත් කර තිබියදී, 2024.02.21 දින පැවති අංක 292/8 දරණ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙය හිතාමතා හෝ වැරදි ක්‍රියාවක් ලෙස නොපෙනෙන බැවින් ඒ සඳහා විනය ක්‍රියාමාර්ග අවශ්‍ය නොවන බවට තීරණය කිරීම ද ගැටළු සහගත වේ.

   තවද එම තීරණය ගෙන ඇත්තේ අදාළ පත්වීම සී.සී. අයිලප්පෙරුම මහතාට ලබාදීමෙන් පසුව බව ද නිරීක්ෂණය වේ.

ඒ අනුව මුදල් අමාත්‍යාංශය විසින් පවත්වන ලද ස්වාධීන විමර්ශනය අවසානයේදී පහත නිර්දේශ ඉදිරිපත් කර ඇත.

1. ආයතනයේ විනය කටයුතුවල විනිවිදභාවයක් නොමැති බැවින් විනය කටයුතු නිවැරදිව විධිමත්ව සිදුකිරීම.
2. මූලික විමර්ශනවලින් චෝදනාපත්‍ර ලබාදීමට නිර්දේශ කර ඇති නිලධාරීන්ගේ විනය පරීක්ෂණ කඩිනමින් අවසන් කර එම විනය නියෝග ලද පසුව උසස්වීම් පිළිබඳ තීරණ ගැනීම.

3. මෙවැනි තත්ත්වයන් ආයතනයේ වෙනත් නිලධාරීන්ට පූර්වාදර්ශයක් නොවිය යුතු බවත්, ආයතන කටයුතු කෙරෙහි අනෙකුත් නිලධාරීන්ගේ විශ්වාසනීයත්වය රැකෙන අයුරින් කටයුතු කිරීම.

4. පැමිණිලිකරු විසින් සම්මුඛ පරීක්ෂණයට පෙර කරන ලද බලපෑම් සහ ප්‍රකාශ සම්බන්ධයෙන් විනය කටයුතු සිදුකිරීම.

සහකාර සාමාන්‍යාධිකාරී (විකුණුම්) තනතුරට සුදුසු තැනැත්තන් තෝරා පත් කර ගැනීම සඳහා 2024.01.30 දින පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයේදී ලබාගෙන ඇති ලකුණු අනුව, එම තනතුර ලබා ගැනීම සඳහා සුදුසුකම් ලැබූ සී.සී. අයිලප්පෙරුම මහතා සහ එම්.බී.එම්.එන්.කේ.බලගල්ල මහතා හට ප්‍රශ්නගත කාරණය සම්බන්ධයෙන් කරුණු දැක්වීමට අවස්ථාව ලබාදෙන ලදී.

**සී.සී. අයිලප්පෙරුම මහතාගේ කරුණු දැක්වීම:**

2024.01.30 දින සහකාර සාමාන්‍යාධිකාරී (විකුණුම්) තනතුරට තෝරා පත් කර ගැනීම සඳහා පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදී ඇති ප්‍රධාන නිර්ණායක යටතේ වන උප නිර්ණායක හෝ එම උප නිර්ණායක සඳහා ලකුණු ලබාදෙන ආකාරය තමා දැනුවත්ව නොසිටි බවත්, එම තනතුර සඳහා බඳවා ගැනීමේදී සලකා බලන ලද මූලික සුදුසුකම් තමා සපුරා තිබූ බවත්, 2021.12.14 දින සිට තමා සහකාර සාමාන්‍යාධිකාරී (විකුණුම්) වැඩ බැලීමේ තනතුරෙහි ද රාජකාරී කර ඇති බවත්, සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ විකුණුම් ඉහල නැංවීම සඳහා එක් කලාපයකට පමණක් සීමා නොවන පරිදි සමස්ථ දිවයිනම ආවරණය වන පරිදි සේවය සපයා ඇති බවත්, සාමාන්‍යාධිකාරී විසින් විශේෂ රාජකාරී පවරන අවස්ථාවලදී එම රාජකාරි නොපිරිහෙලා ඉටු කර ඇති බවත් ප්‍රකාශ කර ඇත.

තවද වැඩිදුරටත් කරුණු දක්වමින් සඳහන් කර ඇත්තේ, තමා ගනේමුල්ල සිංහ සමාජයේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරමින් සිටින කාලවකවානුවේදී (තමාගේ මතකය පරිදි 2023) කටුනායක 18 කණුව ප්‍රදේශයේ පොඩි දරුවෙකු සමඟ ටිකට්පත් විකුණමින් යන කාන්තාවක් දුටු බවත්, ඇයගේ අවශ්‍යතාවය පරිදි පාපැදියක් අළුත්වැඩියා කර ටිකට්පත් විකිණීමට හැකි මට්ටමට සකස් කර දුන් බවත්, එම අවස්ථාව වන විට එම කාන්තාවගේ සියලු ව්‍යාපාර කටයුතු අඩාල වී තිබූ බැවින් සිංහ සමාජයේ සාමාජිකයින් ඇය සන්තකයේ තිබූ සියලු ටිකට්පත් මිලදීගත් බවත්, දින 3කට පමණ පසුව බලන විට එම ටිකට්පත් කල් ඉකුත් වී ඇති බවට නිරීක්ෂණය වූ බැවින් ඒ සම්බන්ධයෙන් ගිණුම් අංශයෙන් විමසා ඔවුන් විසින් තම සහයකයාට ලබාදුන් උපදෙස් පරිදි සියලු තොරතුරු ලබාදුන් බවත්, එම ටිකට්පත්වල තිබූ දිනුම් සඳහා රු.11,000ක මුදලක් තමාට නැවත භාරදුන් බවත්, පසුව මෙම සිද්ධිය සම්බන්ධයෙන් තුන්වන පාර්ශවයක් විසින් මූලික පරීක්ෂණයක් පවත්වන ලද බවත්, එහිදී තමා විසින් සියලු සාක්ෂි ඉදිරිපත් කළ බවත්, පසුව අදාළ තීරණය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කර සිද්ධිය අවසන් කළ බවට තමාට දැනගන්නට ලැබුණු බවත් ය.

**එම්.බී.එම්.එන්.කේ.බලගල්ල මහතාගේ කරුණු දැක්වීම:**

2024.01.30 දින සහකාර සාමාන්‍යාධිකාරී (විකුණුම්) තනතුරට තෝරා පත් කර ගැනීම සඳහා පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදී ඇති ප්‍රධාන නිර්ණායක යටතේ වන උප නිර්ණායක හෝ එම උප නිර්ණායක සඳහා ලකුණු ලබාදෙන ආකාරය තමා දැනුවත්ව නොසිටි බවත්, එම තනතුර සඳහා බඳවා ගැනීමේදී සලකා බලන ලද මූලික සුදුසුකම් තමා සපුරා තිබූ බවත්, එම සුදුසුකම්වලට අමතරව තවත් සුදුසුකම් තමා සපුරා තිබූ බවත්, අදාළ සම්මුඛ පරීක්ෂණයේදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ඉදිරියේ තමාගේ කුසලතාවයන් හොඳින් ඉදිරිපත් කිරීමට හැකිවූ බැවින් එම තනතුර සඳහා තමා තේරී

පත්වන්නට ඇතැයි විශ්වාස කරන බවත් ප්‍රකාශ කර ඇත. ආයතනයේ උන්නතිය වෙනුවෙන් තමා රාජකාරී කර ඇති බවත්, තම රාජකාරි කටයුතු එක් ප්‍රදේශයකට සීමා නොවන පරිදි සමස්ථ දිවයිනම ආවරණය වන පරිදි සිදුකළ බවත්, සම්මුඛ පරීක්ෂණයේදී ඉහල ලකුණු ලබා ගැනීමට එම කරුණු හේතු වන්නට ඇති බවට තමා විශ්වාස කරන බවත් වැඩිදුරටත් දක්වා ඇත.

ඒ අනුව, සහකාර සාමාන්‍යාධිකාරී (විකුණුම්) තනතුරට තේරී පත්වූ සී.සී. අයිලප්පෙරුම මහතාගේ සහ එම්.බී.එම්.එන්.කේ.බලගල්ල මහතාගේ කරුණු දැක්වීම් සලකා බැලීමේදී ද 2024.01.30 දින සහකාර සාමාන්‍යාධිකාරී (විකුණුම්) තනතුරට තෝරා පත් කර ගැනීම සඳහා පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයට පෙර එම සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදෙන ප්‍රධාන නිර්ණායක යටතේ වන උප නිර්ණායක හෝ එම උප නිර්ණායක සඳහා ලකුණු ලබාදෙන ආකාරය ඔවුන් දැනුවත්ව නොසිටි බව නිරීක්ෂණය වේ.

**නිගමනය :**

ඉහත නිරීක්ෂණවලට අනුව, සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් සහකාර සාමාන්‍යාධිකාරී (විකුණුම්) තනතුරට සුදුසු තැනැත්තන් තෝරා පත් කර ගැනීම සඳහා 2024.01.30 දින පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයේදී යොදාගත් ලකුණු ලබාදීමේ පටිපාටියේ මූලික නිර්ණායක යටතේ වන උප නිර්ණායක සහ එම උප නිර්ණායක සඳහා ප්‍රදානය කළ ලකුණු ප්‍රමාණය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කර විධිමත් පරිදි අනුමැතිය ලබාගෙන නොමැති බැවින් ද, සම්මුඛ පරීක්ෂණයට පෙර අදාළ ලකුණු ලබාදීමේ පටිපාටි ප්‍රසිද්ධ කිරීමට කටයුතු කර නොමැති බැවින් ද, සම්මුඛ පරීක්ෂණය පැවැත්වූ දිනයේදී, එනම් 2024.01.30 දින සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින්ම අනුමත කරගත් ලකුණු ලබාදීමේ පටිපාටියකට අනුව සම්මුඛ පරීක්ෂණය පවත්වා ඇති බැවින් ද, සහකාර සාමාන්‍යාධිකාරී (විකුණුම්) තනතුරට සුදුසු තැනැත්තන් තෝරා පත් කර ගැනීම සඳහා 2024.01.30 දින පවත්වන ලද සම්මුඛ පරීක්ෂණය තුළින් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාවෙහි සඳහන් නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීමද, නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය යන අයිතිවාසිකම වගඋත්තර පාර්ශවය විසින් උල්ලංඝනය කර ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශය කර සිටී.**

සහකාර සාමාන්‍යාධිකාරී (විකුණුම්) තනතුරට සුදුසු තැනැත්තන් තෝරා පත් කර ගැනීම සඳහා 2024.01.30 දින පවත්වන ලද සම්මුඛ පරීක්ෂණය අවලංගු කර, නැවත අයදුම්පත් කැඳවා එම සම්මුඛ පරීක්ෂණය පැවැත්විය යුතුය.

සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනයේදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින්ම අනුමත කරගත් ලකුණු ලබාදීමේ පටිපාටියකට අනුව සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් අඛණ්ඩව සිදුකර ගෙන ආ පිළිවෙතක් වන බැවින් මින් ඉදිරියට සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමේදී අදාළ ලකුණු ලබාදීමේ පටිපාටි විධිමත් පරිදි අනුමත කර ගැනීමට සහ සම්මුඛ පරීක්ෂණයට පෙර එම ලකුණු ලබාදීමේ පටිපාටි ප්‍රසිද්ධ කිරීමට පියවර ගත යුතුය.

එමෙන්ම මුදල් අමාත්‍යාංශය විසින් පවත්වන ලද ස්වාධීන විමර්ශනය අවසානයේ ලබා දී ඇති නිර්දේශ අනුව කටයුතු කිරීමට වගඋත්තර පාර්ශවය පියවර ගත යුතුය.

2025.09-16 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙසට 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 15(7) වගන්තිය ප්‍රකාරව වගඋත්තර පාර්ශවය වෙත මෙයින් දන්වා සිටිමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ අදාළ නිර්දේශය ක්‍රියාත්මක කර තිබේද නැද්ද යන්න පැමිණිලිකරු විසින් කොමිෂන් සභාව වෙත දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වා සිටිමු.

එල්.ටී.බී. දෙහිදෙණිය,
විශ්‍රාමික ගරු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු,
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත් -: (1) අමාත්‍යතුමා,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය,
මහලේකම් කාර්යාලය,
කොළඹ 01.

(2) ලේකම්,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය,
මහලේකම් කාර්යාලය,
කොළඹ 01.